උඩුදුම්බර ප්‍රාදේශීය සභාව - 2024
----

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල සභාව සතු ගොඩනැඟිලි 05ක් හා ජල යෝජනා ක්‍රමයක් සංවර්ධනය කිරීම සඳහා වැය කර තිබුණු එකතුව රු. 9,161,969 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ආ)	ඉකුත් වර්ෂයේ දී තම්මැටියාන ඉඩම් වෙන්දේසියෙන් පොදු කටයුතු සඳහා සභාවට පවරා දී තිබුණු රු.300,000 ක් වූ රූඩ් 02 පර්චස් 39.03 ක ඉඩම් වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.	එම	එම
(ඇ)	ආදාහනාගාරයක් ඉදිකර නොතිබියදී 2020 වර්ෂයේ වැටක් ඉදිකිරීම සඳහා වැයකළ රු.992,481 ක් හුන්නස්ගිරිය ආදාහනාගාරය සාවද්‍ය ලෙස ගිණුම්ගත කර තිබුණි.	එම	එම

1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.7,278,503 ක් වූ වත්කම් විෂයයක සහ රු.155,241 ක් වූ වගකීම් විෂයකට අදාළ ලේඛන, උපලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව.	ගිණුම් විෂයයන් සනාථ කිරීම සඳහා අදාළ උප ලේඛන පිළියෙල කර ඉදිරිපත් කර ගත යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**			
(i)	128 වගන්තිය	සභාව විසින් පොදු කටයුතු සඳහා භාවිතා කරනු ලබන ඉඩම් කොටස් 116 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාළ ඉඩම්වල අයිතිය පවරා ගැනීමට අදාල ඉදිරි කටයුතු සිදුකරන බව.	සභාව සතු ඉඩම්වල අයිතිය පවරා ගත යුතුය.
(ii)	149 වගන්තිය	සභාබල ප්‍රදේශයේ පිහිටි හෝටලයක ආදායමින් සියයට එකකට නොඅඩු බලපත්‍ර ගාස්තු රු.329,950 ක් අඩුවෙන් අයකර තිබුණු අතර, එක් හෝටලයකින් අදාල ගාස්තු අයකර ගෙන නොතිබුණි.	විගණනය විසින් පෙන්වා දුන් පරිදි හිඟ මුදල් අයකරගැනීමට කටයුතු කරන බව.	ආදායම් නිවැරදිව ගණනය කර අයකර ගත යුතුය.
(ආ)	**1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති**			
	218 රීතිය	ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳව සෑම වර්ෂයකට වරක්ම සමීක්ෂණය කළ යුතු වුවත්, සභාව විසින් 2007 වර්ෂයෙන් පසුව වත්කම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.	විගණනය විසින් ලබාදුන් උපදෙස් ප්‍රකාරව කටයුතු කරන බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂිකව සමීක්ෂණ සිදු කළ යුතුය.
(ඇ)	**චක්‍රලේඛ**			
	2024 අප්‍රේල් 22 දිනැති අංක CPC/CLG/4/4 ඉංජිනේරු පොදු දරණ පළාත් පාලන ඉංජිනේරුගේ චක්‍රලේඛයේ 13 වගන්තිය	කොන්ක්‍රීට් මාර්ග ඉදිකිරීමේදී එහි ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා කොන්ක්‍රීට් සාම්පල පරීක්ෂණ (Cube Test), කොන්ක්‍රීට් ඝනකම තහවුරු කර ගැනීමට Core Cutter Test සිදු කිරීමටත්, එම පරීක්ෂණ වාර්තා අසමත් වන්නේ නම් පමණක් සම්පීණ්ඩන පරීක්ෂණ (Hammer Test) සිදු කිරීමටත්	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Core Cutter Test සිදු නොකරන ලෙස උපදෙස් දී ඇති අතර සම්පිණ්ඩන පරීක්ෂාව සිදුකර ඇත.	පළාත් පාලන ඉංජිනේරු ලබාදී ඇති උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

උපදෙස් දී තිබුණද සමාලෝචිත වර්ෂයේ ඉටුකළ ව්‍යාපෘති 33 ක කොන්ක්‍රීට් සාම්පල් පරීක්ෂණ හෝ Core Cutter Test සිදුකර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,557,431 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,255,725 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	**ඇස්තමේන්තුගත ආදායම**	**බිල් කළ ආදායම**	**රැස් කළ ආදායම**	**දෙසැම්බර් 31 දිනට මුළු හිඟය**	**ඇස්තමේන්තුගත ආදායම**	**බිල් කළ ආදායම**	**රැස් කළ ආදායම**	**දෙසැම්බර් 31 දිනට මුළු හිඟය**
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	1,980,500	2,103,318	2,474,806	403,979	1,960,500	1,171,997	1,136,564	775,467
(ii)	කුලී	3,135,500	3,506,786	2,418,444	4,746,118	3,066,400	3,237,963	3,384,795	3,657,776
(iii)	බලපත්‍ර ගාස්තු	725,600	829,961	822,411	129,300	722,650	614,100	603,350	121,750
(iv)	වෙනත් ආදායම්	9,856,000	11,847,287	14,394,724	6,062,742	42,583,400	43,351,616	40,914,621	8,610,179
	එකතුව	15,697,600	18,287,352	20,110,385	11,342,139	48,332,950	48,375,676	46,039,330	13,165,172

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වරිපනම් හා බදු		
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟය රු.346,204ක් වූ අතර, ඉන් වසර 01 ත් 03 ත් අතර කාලයක සිට අය නොවී පවතින ශේෂය රු.92,323 ක්ද, වසර 03 ට වැඩි කාලයක සිට අය නොවී පවතින ශේෂය රු.45,767 ක් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර අයකර නොතිබුණි.	දේපළ තහනම් කිරීමේ වැඩසටහනත් පවත්වා හිඟ වරිපනම් මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ වරිපනම් බදු පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අය කර ගත යුතුය.
(ආ) කුලී		
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමර 21 කින් එකතුව රු.4,456,026 ක කඩකුලී 2015 වර්ෂයේ සිට අයකර නොතිබුණි.	සභාව සතු කඩ කාමර වලින් කඩ 06 සඳහා හිඟ අයකර ගැනීමට නඩු පවරා ඇති අතර, එම නඩු මේ වන විට විභාග වෙමින් පවතී. නඩු කටයුතු අවසන් වී ලැබෙන තීන්දුව අනුව ඉදිරි කටයුතු කරන බව.	කාලීනව කඩ කුලී අයකළ යුතුය.
(ඇ) ජල ගාස්තු		
සභාවට අයත් ජල යෝජනා ක්‍රම 03 ක ජල සම්බන්ධතා විසන්ධි කළ ජල පාරිභෝගිකයන් 59 ක ගෙන් වසර 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ජල ගාස්තු රු.250,326 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	හිඟ ජල ගාස්තු අදාල පාර්ශවයන්ට ලිපි මගින් දැනුම් දී ඇති අතර, ඉදිරියේ දී නීත්‍යානුකූලව කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතුය.

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.262,047 ක් හා මුද්දර ගාස්තු රු.4,334,340 ක් විය. මේ තුළ 2012 සිට 2018 දක්වා හිඟ හිටි රු.1,353,490 ක මුද්දර ගාස්තු ශේෂයක් ඇතුළත්ව ඇත.	හිඟ ශේෂය අයකර ගැනීම සඳහා ඉල්ලීම් ලිපි පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමු කර ඇති බව.	ලැබිය යුතු ආදායම් ගෙන්වා ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අගෝස්තු 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වගන්තිය ප්‍රකාරව සභාව විසින් සති පොළක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.	හුන්නස්ගිරිය සතිපොළ කොරෝනා වසංගත තත්වයෙන් පසු සතිපොළ කටයුතු නැවතුණු අතර අවස්ථා කීපයකදීම උත්සාහ දැරුවත් එම කටයුත්ත සාර්ථක කර ගැනීමට නොහැකි බව.	බල ප්‍රදේශයේ ජනතාවගේ පොදු සුභ සාධනය වෙනුවෙන් පනතේ කාර්යයන් ඉටුකළ යුතුය.
(ආ)	කොවුලේගම ප්‍රදේශයේ අක්කර 01 ක පමණ භූමියක 2010-2017 කාලපරිච්ඡේදය තුල එකතුව රු.8,556,968 ක් වැයකර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය ඉදිකර යන්ත්‍ර සූත්‍ර මිලට ගෙන කසල කළමණාකරන ඒකකයක් ස්ථාපිත කර තිබුණද අරමුණු ගත කාර්යයන් ඉටු නොකර, කසල දිරන හා නොදිරන වශයෙන් වෙන් නොකර, කාබනික පොහොර නිෂ්පාදනයට කටයුතු නොකර, සමාලෝචිත වර්ෂයේ එකතු කර තිබුණු කසල, කසල අංගන ගොඩනැගිල්ලේ දුර්ගන්ධයක් සහිතව එකතැන ගොඩගසා තිබූ බවත්, 2019 වර්ෂයේ සිට එකතු කර තිබූ නොදිරන කසල පරිශ්‍රයේ ගොඩනැගිල්ලක හා කසල අංගන භූමියේ අවිධිමත්ව ගොඩගසා තිබුණු බවත් නිරීක්ෂණය විය.	2024 වර්ෂයේ අවස්ථා කිහිපයකදී මෙම අංගනය වෙත ප්‍රවේශ වන මාර්ගය නාය යාමට ලක්වීම හා අධික වර්ෂාව හේතුවෙන් කාලසටහනකට අනුව කසළ ප්‍රවාහනය කිරීමේ දුෂ්කරතා පැන නැගී ඇති බව හා කාලසටහනකට අනුව කසළ වෙන්ව ලබා ගැනීම සිදු කරන බව.	අදාල වත්කම් උපයෝජනය කර කසල කළමනාකරණය විධිමත් හා කාර්යක්ෂම කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉකුත් වර්ෂයේ ජූනි 15 දින සිට වැටුප් රහිත නිවාඩු ලබා ගෙන සිටින සංවර්ධන නිලධාරිවරයෙකුට 2023 ජූනි මාසය සඳහා දින 15 කට පමණක් වැටුප් ගෙවිය හැකි වුවත් සම්පූර්ණ මාසය සඳහා වැටුප් ගෙවීම හේතුවෙන් රු.25,191 ක් වැඩිපුර ගෙවා තිබුණි.	සංවර්ධන නිලධාරිවරයා දැනුවත් කර ඇති අතර, ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වැඩිපුර ගෙවීම අයකර ගැනීමට හා ඉදිරියේ දී අඩුපාඩු වැළැක්වෙන පරිදි අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංවර්ධන ව්‍යාපෘති ණයගැති ශේෂ එකතුව රු.12,295,411 ක් වූ අතර, ඉන් වසර 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබුණු ශේෂය රු.3,573,410 ක්ද, වසර 05 ක් ඉක්මවූ ශේෂය රු.137,058 ක්ද විය.	රු.2,003,978.16 ක මුදලක් කපා හැරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා 2024 දෙසැම්බර් 20 වන දින යොමුකර ඇත.අනුමැතිය ලද පසු අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව.	ණයගැති ශේෂ කඩිනමින් අයකර ගැනීමට හෝ විධිමත් පරදි කපා හැරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංවර්ධන ව්‍යාපෘති ණයහිමි ශේෂ එකතුව රු.9,897,895 ක් වූ අතර, ඉන් වසර 01ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබුණු ශේෂය රු.1,443,331 ක්ද වසර 05 ක් ඉක්මවූ ශේෂය රු.228,317 ක් ද විය.	ඉදිරියේ දී මෙම ශේෂය නිවැරදි කරන බව.	ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු එකතුව රු.12,451,644 ක් වූ වාහන 04 ක් සහ ට්‍රැක්ටර් ට්‍රේලර් රථ 02ක් වසර 04 ත් වසර 08 ත් අතර කාල පරිච්ඡේදයක සිට භාවිතයෙන් තොරව පවතින අතර, මෙම වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	අළුත්වැඩියා කළහැකි වාහන අළුත්වැඩියා කිරීමට ද, අළුත්වැඩියා කළ නොහැකි වාහන වෙන්දේසි කිරීමට ද කටයුතු කරන බව.	වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ රු.70,960,398ක් වැයකර 2016 වර්ෂයේ ඉදිකර තිබුණු මහල් තුනකින් සමන්විත, වර්ග අඩි 4870ක හුන්නස්ගිරිය බහුකාර්යය ගොඩනැඟිල්ලේ අංක 02, 03 හා 05 යන කඩ කාමර භාවිතයකින් තොරව පැවතුණි. හුන්නස්ගිරිය සතිපොල මෙම ස්ථානයේ බිම් මහලේ පවත්වාගෙන ගොස් තිබුණු අතර, 2022 වර්ෂයේ සිට මේ දක්වා සති පොළ ද පැවැත්වීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් බිම් මහල ද නිෂ්කාර්යයව පැවතුණි. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ අපේක්ෂිත අරමුණු ඉටු නොවන බවත්, එහි නඩත්තු කටයුතු සිදු නොවන බැවින් ගොඩනැඟිල්ල විනාශ වෙමින් පවතින බවක් නිරීක්ෂණය විය.	මෙම ගොඩනැගිල්ල මින් ඉදිරියට ක්‍රියාකාරීව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	ගොඩනැගිල්ල ඵලදායී කාර්යයන් සඳහා උපයෝජනය කළ යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ මාර්ග සම්මත මිල රේටයන්ට අනුව සිමෙන්ති කි.ග්‍රෑ.50 මිටියක මිල රු.1,891 ක් ලෙස දක්වා තිබුණු අතර, 2024 වර්ෂය තුළ වෙළඳපල මිල රු.1,800 ක්ද වී තිබුණි. එසේ වුවත් කඳුරට දශකය, පළාත් නිශ්චිත හා ප්‍රාදේශීය සභා අරමුදල මඟින් සිදුකළ ව්‍යාපෘති 33 ක මාර්ග හා කාණු ඉදිකිරීමේදී සිමෙන්ති කි.ග්‍රෑ. 50 මිටි 01ක් සඳහා කොන්ත්‍රාත් කරුවන්ට රු.2,200 ක විශේෂ මිලක් ලබාදී අනුමැතියකින් තොරව රු.1,057,185 ක් වැඩිපුර ගෙවා තිබුණි.	කඳුරට දශකය ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී සිමෙන්ති මිල රු.2,200 ක් ලෙස යොදන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලිඛිතව උපදෙස් ලබාදුන් බැවින් ඒ අනුව ඇස්තමේන්තු සකස් කර ඇති බව.	මාර්ග සම්මත මිල රේටයන් (HSR) අනුව ගෙවීම් කළ යුතු බැවින් වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය.
(ආ)	සංවර්ධන ව්‍යාපෘති සඳහා මැටල් ප්‍රවාහනය කිරීමට ගාස්තු ගෙවීම් කිරීමේදී බල ප්‍රදේශයේ ව්‍යාපෘතියට ළඟම පිහිටි ගල් කොරි වල සිට පවතින දුර සමඟ බිල්පත අනුව ගෙවන ලද දුර ප්‍රමාණයන් සැසඳීමේ දී ව්‍යාපෘති 33 ක සාවද්‍ය ලෙස දුර දක්වා රු.388,497ක ප්‍රවාහන වියදම් වැඩිපුර ගෙවා තිබුණි.	වැඩිපුර ගෙවා ඇති මුදල් අතුරුදවුම් වලින් අඩුකිරීමට කටයුතු කරන බව.	වැඩිපුර ගෙවීම් අයකළ යුතුය.

(ඇ)	ප්‍රාදේශීය සභාවේ ඉදිකිරීම් කටයුතු සඳහා සභාවේ සිට කි.මී. 27 ක දුරකින් පිහිටි මහියංගනය ප්‍රදේශයේ ගංගා වැලි ලබාගැනීමේ හැකියාව පැවතිය දී ඊට කි.මී. 60 ක් දුරින් පිහිටි මහඔය ප්‍රාදේශයේ සිට වැලි ප්‍රවාහනය කළ බව දක්වා කොන්ත්‍රාත් කරුවන්ට ගෙවීම් කිරීම හේතුවෙන් පරීක්ෂණයට භාජනය වූ ව්‍යාපෘති 33 ක් සඳහා එකතුව රු.1,109,929 ක් වැඩිපුර ගෙවා තිබුණි.	2021 වර්ෂයේ සිටම මහියංගන වැලි හිඟතාවය හා ගුණාත්මකතාවය අඩුවීම පිළිබඳ ගැටළු පවතී. ඒ අනුව මහඔය ප්‍රදේශයෙන් වැලි සැපයුම් කරන බව.	දිස්ත්‍රික් මිල කමිටු වාර්තාවලට අනුව කටයුතු කර වැඩිපුර ගෙවීම් අයකළ යුතුය.
(ඈ)	2024 වර්ෂයේ කඳුරට දශකය වැඩසටහන යටතේ සූරිය අරණ මාර්ගය සංවර්ධනය සඳහා රු.1,440,561 ක් ගෙවීම් කර තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාල ගෙවීම් පරීක්ෂාවේ දී 2024 වර්ෂයේ මාර්ග සම්මත මිල රේටය අනුව ABC මිශ්‍රණය වෙනුවෙන් ඝන මීටරයක් සඳහා රු.6,429 ක් ගෙවිය හැකි වුවත් රු.20,000 ක් ගෙවීම හේතුවෙන් ඝන මීටර් 10.75 කට රු.145,888 ක්ද, හැඩයම් ලෑලි (Form Work) සඳහා වර්ග මීටරයකට රු.1,536ක් ගෙවිය හැකි වුවත්, රු.2,500ක් ගෙවීම හේතුවෙන් වර්ග මීටර් 23.50 කට රු.22,654 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.	කඳුකර දශකය වැඩසටහනේ මී මුරේ සූරිය අරණ ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා සමිතියක් ඉදිරිපත් නොවූ හෙයින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල කැඳවා ඔහු මගින් ව්‍යාපෘතිය සිදුකරන ලෙස දන්වන ලදි. ඒ අනුව තෝරාගත් කොන්ත්‍රාත්කරු අයිතම සඳහා ඉදිරිපත් කරන ලංසු අනුව බිල්පත් පරීක්ෂාකර ගෙවීම සිදු කරන බව.	මාර්ග සම්මත මිල රේට අනුව ගෙවීම් කළ යුතු අතර වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට තනතුරු 09 ක පුරප්පාඩු 15 ක් නිරීක්ෂණය විය.	තනතුරු පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කරන බව.	පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය.